# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,209 — 1921ක්වූ සැප්තැම්බර් මස 9වෙනි දිනවූ සිකුරාදා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම හෝ සඳහා දැන්වීම.

**No. 3,325, W. P.**—බස්නාහිර දිසාවේ කළුතර උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් වෙන්දේසි සම්බන්ධ 35වෙනි නියෝගයේ ප්‍රකාරයට වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 24වෙනි දිනවූ සඳුදා පෙරවරු 10ට කළුතර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මේ ඉඩම මාදෙලවත්ත සහ කිරිවානකැටියවත්තට යාව තිබෙන බැවින් එම වෙන්දේසියේදී ලන්සු තබන්ට පුළුවන් මෙකී වතු දෙකේ අයිතිකාරයින්ට පමණයි. බස්නාහිර දිසාවේ කළුතර පලාතේ නැගෙණහිර පස්දුන්කෝරලේ කොඩසේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මුල් සිතියම 10,348. ගම—පරගොඩ,ගහබොඩපත්තුව. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 159 | කොන්කන්දෙකැකිල .. | සුපිරින්ටැන්ඩන්ට් මාදෙලවත්ත .. | පතන .. | 7 0 32 | 160 |

මෙම ඉඩම ගැණ වැඩිදුර කාරණ කළුතර උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, එහි සිතියම සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 7වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ග්‍රීම් තොම්සන්,
මහසෙක්‍රතාරිස් වර්‍ගය.

---

වර්ෂ 1921ක්වූ අගෝස්තු මස 5වෙනි දින නිකුත්කරණලද නොම්මර. 7,201කේ ගැසට් පත්‍රයේ ප්‍රසිඩ කරණලද වයඹ දිසාවේ මුල් සිතියමේ නොම්මර. 4,537 A න් පෙණෙන පහල බඩලාගේ සහ බමුනුස්සේ ඉඩම් විකිනීම මෙයින අස්කර ගන්ට යෙදුනා ඇත.

ග්‍රීම් තොම්සන්,
මහ සෙක්‍රතාරිස් තැන වර්‍ගය.

---

**No. 2,164 N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දිනවූ බදාදා පස්වරු 1ට අනුරාධපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ නුවරගම් පලාතේ පිහිටා තිබෙන බිම්කැබලි 30ක්.

සිතියම 5. ගම—විලච්චියකෝරලේ කටුපත්වැව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1C | කටුපත්වැවකැලේ .. | පී. අප්පුහාමි .. .. | ලඳුකැලේ .. | 5 2 5 | 21 |
| | | සිතියම 22. ගම—කනදරකෝරලේ තරියන්කුලම. | | | |
| 3A | ගම්පාරඉහලහේන .. | කේ. උක්කුවා .. .. | කැලේ .. | 4 1 23 | 23 |
| 18 | තරියන්කුලමකැලේ .. | — .. .. | එම .. | 5 0 20 | 22 |
| 18E | එම .. | ටී. ටිකිරා ජේඩියා .. .. | එම .. | 4 0 6 | 22 |
| 18F | එම .. | නෙලුන්කන්නියේ ඇන්. ටී. බසියා හිඳන ජේඩියා | එම .. | 5 0 25 | 22 |
| 18I | එම .. | — .. .. | එම .. | 1 0 25 | 23 |
| 18F | එම .. | කේ. එච්. උක්කුවා .. .. | වියට සුදුසු කැලේ | 0 1 6 | 23 |
| 10G | එම .. | එම .. .. | එම .. | 0 2 36 | 23 |
| 18B | එම .. | බන්ඩියාලන්කුලමේ ඇස්. එච්. පුලින්ගුවා .. | එම .. | 2 1 9 | 23 |
| 12 | කුඹුරපාවුල .. | — .. .. | පුලිංගුවා විසින් අල්ලාගෙන තිබෙන කුඹුර | 0 0 29 | 30 |
| | | සිතියම 24. ගම—කනදරකෝරලේ නෙලුන්කන්නිය. | | | |
| 1H | නෙලුන්කන්නියකැලේ .. | ඇස්. මනවලා .. .. | වියට සුදුසු කැලේ | 6 0 2 | 27 |
| 1I | එම .. | එම .. .. | එම .. | 2 3 8 | 27 |
| 1K | එම .. | ඒ. මනවලා .. .. | එම .. | 9 3 39 | 27 |
| 1L | එම .. | එම .. .. | එම .. | 0 2 6 | 27 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1M | හෙලුන්කන්නියකැලේ .. | කේ. පුන්චා වෙල්පේඩියා .. | .. පියටසුදුසුකැලේ .. | 2 | 0 | 38 | 24 |
| 1N | එම .. | එම .. | .. කැලේ .. | 1 | 0 | 11 | 24 |
| 3H | හෙලුන්කන්නියමූකලාන | බන්ඩියාලන්කුලමේ ඇස්. එච්. පුලිංගුවා .. | එම .. | 2 | 0 | 8 | 24 |

සිතියම 670. ගම—විලච්චියකෝරලේ දිවුල්වැව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 24D | දිවුල්වැවලන්ද නොහොත් දිවුල්වැවකැලේ | තමුත්තේගම එච්. ඇම්. චන්තිහාමි .. | හේන .. | 2 | 0 | 7 | 40 |
| 24E | එම .. | ගාලේවැවේ කේ. වේලාතේ .. .. | එම .. | 3 | 3 | 37 | 40 |

සිතියම 677. ගම—විලච්චියකෝරලේ පොතානේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 16D | සියඹලාගහඉඩම .. | සියඹලාගහගම කේ. පූලා හිටපු දුරයා සහ තවත් කෙනෙක් | හේන .. | 1 | 0 | 4 | 21 |

සිතියම 713. ගම—විලච්චියකෝරලේ වැලියාව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 36 | සියඹලාගහහේන .. | බී. වී. අප්පුහාමි සහ තවත් 20 දෙනෙක් .. | හේන .. | 2 | 0 | 26 | 24 |
| 38D | එම .. | එම .. | .. එම .. | 8 | 1 | 21 | 24 |

සිතියම 726. ගම—විලච්චියකෝරලේ ඇහැටුවාගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 2D | අන්දරලන්දේයාය .. | කේ. බන්ඩා .. | .. හේන .. | 0 | 0 | 26 | 21 |
| 2E | එම නොහොත් වෙල්කටුව | එම .. | .. එම .. | 2 | 0 | 10 | 21 |
| 2C1 | — .. | — .. | .. දූහට අත්හැර තිබෙන කරතහපාර | 0 | 0 | 9 | 21 |
| 5 | — .. | — .. | .. එම .. | 0 | 1 | 1 | 21 |
| 6B | වෙල්කටුවේහේන .. | — .. | .. හේන .. | 2 | 2 | 2 | 21 |

සිතියම 765. ගම—කනදරකෝරලේ අඹගහවල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 21 | ලඳුහේන .. | — .. | .. හේන .. | 0 | 3 | 26 | 21 |
| 34 | අඹගහවලකැලේ .. | — .. | .. එම .. | 5 | 1 | 18 | 23 |
| 38 | ලඳුහේන .. | ඇස්. පී. කච්චා .. | .. එම .. | 1 | 0 | 8 | 21 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 6වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ග්‍රීම් තොම්සන්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,054, P. of S.**—කෑගළු දිසාත්‍රික්කේ උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 25වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 10ට කෑගල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගළු පලාතේ කිනිගොඩ සහ බෙලිගල්කෝරලවල පිහිටාතිබෙන බිම්කැබලි 16ක්.

සිතියම 3,057. ගම—දූදිගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ලාඋළුගහහේනේගල්අතුල .. | ඇස්. මර්තේනිස් සිඤ්ඤෝ | මූකලාන .. | 0 | 2 | 36 | 51 |

සිතියම 3,072. ගම—පෙහෙරබේ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කොහොඹගහමුලහේනේමූකලාන | ඩබ්ලිව්. හර්මන් .. | මූකලාන .. | 1 | 0 | 24 | 71 |
| | | ගම—සියඹලාපිටිය. | | | | | |
| 2 | එම .. | ඩබ්ලිව්. හර්මන් .. | එම .. | 4 | 2 | 9 | 71 |

සිතියම 3,068. ගම—දූදිගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | අවරදෙනිය හෙවත් ඉළුක්දෙනියෙ මූකලාන | ඇම්. ඩිංගිරිඅප්පුහාමි .. | මූකලාන .. | 0 | 0 | 25 | 101 |
| 2 | එම .. | — .. | වෙන්කරතිබීමට, විකිනීමටනොවේ | 0 | 0 | 12 | — |
| 3 | එම .. | ඇම්. ඩිංගිරි අප්පුහාමි .. | මූකලාන .. | 0 | 3 | 9 | 101 |
| | | අයිතිකමකියන්නා—ඒ. පී. අන්ද්‍රිස් සහ ආණ්ඩුව. | | | | | |
| 4 | එම .. | ඇම්. ඩිංගිරිඅප්පුහාමි .. | හේන .. | 0 | 0 | 20 | 96 |
| | | අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | |
| 5 | එම .. | — .. | වෙන්කරතිබීමට, විකිනීමටනොවේ | 0 | 0 | 4 | — |

සිතියම 3,045. ගම—කන්දේගෙදර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | අඹගහතැන්නෙමූකලාන හෙවත් ගල්වලගාවමූකලාන | ඒ. පිංචිඅප්පුහාමි .. | මූකලාන .. | 0 | 2 | 32 | 66 |
| 2 | එම .. | — .. | වෙන්කරතිබීමට, විකිනීමටනොවේ | 0 | 0 | 31 | — |
| 3 | එම .. | — .. | එම .. | 0 | 0 | 35 | — |
| 4 | එම .. | ඒ. පිංචිඅප්පුහාමි .. | මූකලාන .. | 3 | 1 | 35 | 66 |
| 5 | එම .. | — .. | වෙන්කරතිබීමට, විකිනීමටනොවේ | 0 | 0 | 23 | — |

සිතියම 3,047. ගම—මැනික්කඩවර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | අඹන්ගලමූකලාන .. | — .. | මූකලාන .. | 1 | 3 | 23 | 76 |
| 2 | එම .. | ආර්. ඩබ්ලිව්. බන්ඩා .. | එම .. | 3 | 0 | 31 | 76 |
| 3 | එම .. | — .. | එම .. | 1 | 3 | 38 | 76 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ කෑගල්ලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 3වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ග්‍රීම් තොම්සන්,
මහලේකම්තාරිස් වම්හ.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1911යේ 10වෙනි ආඥාපනතේ 3වෙනි වගන්තියෙන් වෙනස්කරන්ට යෙදුන වර්ෂ 1876යේ 3වෙනි ආඥාපනතේ හයවෙනි වගන්තියේ පංගාඩම් ප්‍රකාර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ කැමැත්ත ඇතුව ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා ගෙවත් වැල්ලවත්තේ ප්‍රසිද්ධ වැසිකිළියක් සාදන පිණිස මෙහි පහත දක්වන ඉඩම ලබාගන්නා පිණිස ක්‍රියාකරණ ලෙස මට නිසිප්‍රකාර නියමකරණ ලද්දේය, එනම් :—

මුල් සිතියම 17,206. ගම—ගාල්ලෙපාර, වැල්ලවත්ත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වරිපනම් නොම්මර 84 (2) දරණ ඉඩමෙන් පංගුව | උළු සහ යකඩ වහලයක් ඇති ලෑලිවලින් සාදපු ගොඩනැගිල්ලක් ඇති හිස්ඉඩම | ඕ. ඇල්. ඇම්. සෙයිනදීන් සහ ඒ. ඇස්. හමීඩ් | 0 0 2·50 |

එබැවින් ඉඩම අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැනීම සඳහා 7වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන අන්දමට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇති සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 12වෙනි බදාදා දවල් 12ට කොළඹ නාගරිකසභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා දන්වා සිටින්ට ඕනෑවා සහ එම ඉඩමට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 6වෙනි දින කොළඹ නගරසභා කන්තෝරුවේදීය.

ටී. ජී. ඩී. ග්ලැන්විල්,
කොළඹ මේයෝර් සහ නගර සභාපතිතැන.

---

වර්ෂ 1911යේ 10වෙනි ආඥාපනතේ 3වෙනි වගන්තියෙන් වෙනස්කරන්ට යෙදුන වර්ෂ 1876යේ 3වෙනි ආඥාපනතේ 6වෙනි වගන්තියේ පංගාඩම් ප්‍රකාර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා එනම්, දෙවෙනි මරදානේ අරබි මුඩුක්කුපාරේ ප්‍රසිද්ධ වැසිකිළියක් සාදනලෙස මෙහි පහත දක්වන ඉඩම ලබාගන්නා ලෙස ක්‍රියාකරණමෙන් මට නිසි ප්‍රකාර නියමකරණලද්දේය, එනම් :—

මුල් සිතියම 17,557. අරබි මුඩුක්කුව, දෙවෙනි මරදාන.

| නො. | ඉඩමේ නම. | විස්තර. | අයිතිකමකියන්නා | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වරිපනම් නොම්මර 84 දරණ ඉඩම | ඇරපු උළුවහලයක් ඇති වඩුමඩුවකින් කොටසක් සහ 30 අවුරුද්දකට වඩා වයස් ඇති පොල්ගහක් ඇති ඉඩම | බම්බලපිටියේ පී. ටී. මීරා ලෙබ්බේ | 0 0 4·13 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇති සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 19වෙනි බදාදා දවල් 12ට කොළඹ නාගරික සභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද යනු දන්වා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 8වෙනි දින කොළඹ නාගරික සභා කන්තෝරුවේදීය.

ටී. ජී. ඩී. ගලැන්විල්,
කොළඹ මේයෝර් සහ නාගරික සභාපතිතැන.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම් :—ඉඹුල්ගොඩ ආණ්ඩුවේ පිරිමි පාඨශාලාවක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම් :—

සිතියම 17,629. ගම—ඉහලඉඹුල්ගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගලබොඩවත්ත .. | පොල්ගස් 53ක් අඩංගු ඉඩම .. | ජේ. ඇම්. දෙන් හෙන්ද්‍රික් සහ තවත් | 0 2 21·3 |
| 2 | අඹගහවත්ත .. | පොල්ගස් 52ක් සහ අතු සෙවිලිකළ ගෙයක් අඩංගු ඉඩම | ජේ. පී. ආර්. කරුණාරත්න .. | 0 3 12·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින දවල් 12ගේ කනිසමට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 6වෙනි දින කොළඹ කච්චේරියේදී.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—තිහාරිය මහමත් පිරිමි පාඨශාලාවක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියම 17,624. ගම—තිහාරිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හික්ගහවත්ත .. | පොල්ගස් 58ක් සහ අතුසෙවිලිකල ගෙයක් අඩංගු ඉඩම | අස්සිසු ලෙබ්බේ සහ සහිදු ලෙබ්බේ .. | 0 3 32·3 |
| 2 | එම .. | පොල්ගස් 3ක් අඩංගු ඉඩම .. | එම .. .. | 0 0 6 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින දවල් 12ගේ කනිසමට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 6වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පාණදුරු නම්බාපානපාරේ හැතැක්ම 1යේ කනුව සමීපයේ පිහිටි අනතුරුදායක මූල පලල් කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මනත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 17,563. ගම—වෑකඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වලව්වේවත්ත .. | පොල්ආදිය අඩංගු ඉඩම .. | ආර්. ඒ. ඇස්. ද සොයිසා මහත්මයා .. | 0 1 9·36 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින පෙරවරු 10යේ කනිසමට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 3වෙනි දින කළුතර කච්චේරියේදීය.

ටී. ඒ. හොඩ්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—සතුන් මරණ මඩුවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මනත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 7,201. ගම—කුඩාදෙනිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කුඩාදෙනියේවත්ත .. | පොල්වත්ත .. | කේ. බී. දසනායක .. .. | 0 0 2·2 |
| 2 | එම .. | එම .. | එම .. .. | 0 0 1·5 |
| 3 | එම .. | එම .. | එම .. .. | 0 0 5·8 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 5වෙනි දින පස්වරු 2ගේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1921ක්වූ අගෝස්තු මස 31වෙනි දින මහනුවර කච්චේරියේදීය.

සී. ඇස්. වෝන්,
මහනුවර ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—තවලන්තැන්න වටගොඩපාරේ 45ගේ හැතැප්ම කනුවලඟ ගල්වලක් සහ ඊට යෑමට පාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මනත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසි ආකාර මට අණලැබී තිබේ ඒ ඉඩම්නම්:—

සිතියම නො. 7,216. ගම—මඩකුඹුර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මඩකුඹුරවත්ත .. | තේ වත්ත .. | කොළඹ සීමාසහිත ඊස්ටන් ප්‍රොඩියුස් ඇන්ඩ් ඇස්ටේට්ස් .. | 2 0 12 |
| 2 | එම .. | තේ වත්ත සහ පාරක් | එම .. .. | 0 0 15 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින උදේ දහයේ කනිසමට නුවරඑලියේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 5වෙනි දින නුවරඑලියේ කච්චේරියේදීය.

ඒ. ටී. ඩයිසන්,
ආණ්ඩුවේ උපඒජන්ත වම්හ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ඇල්කඩුවේ දිස්පැන්සරිය සහ දොස්තර මහත්මයාගේ බංගලාව ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 7,212. ගම—ඇල්කඩුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඇල්කඩුවේවත්තේ කෑල්ලක් .. | තේ සහ රබර් වත්ත .. | බොසන්කේට් කොම්පැනිය .. | 0 1 19·7 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 7වෙනි දින සවස 3නේ කනිසමට ඇල්කඩුවේ තේ ස්ටෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇතතාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 5වෙනි
දින මාතලේ කච්චේරියේදීය.

හැරිසන් ජෝන්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—රිදීගම ආරෝග්‍යශාලාවට සොහොන්භූමියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 793. ගම—වැඋඩවිලිහත්පත්තුවේ මාදුරකෝරලේ වැවගෙදර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 3A | වැවගෙදරවත්ත .. | පොල්ඉඩම .. | (1) සෙයියදු ඊබ්‍රහම්සා, (2) මහමදු ආරච්චි, (3) කමලෙසිඅම්මා .. | 1 1 35 |
| 4J | එම .. | හේන .. | එම .. .. .. | 1 1 5 |

එබැවින් ඉඩම් අයිතිකර ගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 27වෙනි දින පස්වරු 1ට කනිසමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 1වෙනි
දින කුරුණෑගල කච්චේරියේදීය.

ඇෆ්. ජී. ටිරල්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[කුරුණෑගල දැන්වීම නො. 7,949.]

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවළුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනිසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සැම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

### ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ ගිරතලානේකෝරලේ පහලමලනගේ යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—ලංකාමැනීමේ මුල් සිතියම 1,681.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 43A .. | ගලැහේකනත්තේහේන .. .. .. .. | 1 1 33 |

මීට මායිම්—උතුරට කුරුදුකුඹුරෙන් එන පාරද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු ගලහේකනත්තෙවත්තද, (338,672 යන පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩම); දකුණට රජසන්තක කහටගහවෙලේපිල්ලැවද, තෙන්නකෝන්මුදියන්සෙලාගේ රන්මැනිකා විසින් අයිතිකම්කියන කහටවෙලවත්තද; බස්නාහිරට කුරුදුකුඹුර යන ගමේ ගම්ඉමද.

II.—ලංකාමැනීමේ මුල් සිතියම 1,681.

| බිම්කට්ටිය. | ඉඩමේ නාම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 43B .. | ගලැහෙකනත්තේහේන .. .. .. .. | 0 1 24 |

මීට මායිම්—උතුරට කුරුදුකුඹුරෙන් එන පාරද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුණපු ගල්ලැහැකනත්තහේනද, (339,969 යන පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩම); දකුණට රජසන්තක කහටගහවෙලේපිල්ලැවද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණපු ගල්ලැහැකනත්තේවත්තද, (339,679 පිඹුරුකඩදාසියේ පෙනීයන ඉඩම.)

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1209—1210වෙනි පිටුවල ප්ලෑන් බලනු.

III.—ලංකාමැතිමේ මුල් සිතියම 1,681.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 70A | මීගහමූලහේන | 1 0 7 |

මීට මායිම්—උතුරට තෙන්නකෝන්මුදියන්සේලාගේ උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන මූනමල්ගහකුඹුරේයායද, ඇලක්ද; නැගෙණහිරට ආණ්ඩුව විසින් විකුනාපු කුඹුක්ගහමූලවත්තද, (339,933 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම), අවබන්ඩිගේ ලව්රිස් සිල්වා විසින් අයිතිකම්කියන නුගගහමූලහේනද, (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය); දකුණට අවබන්ඩිගේ ලව්රිස් සිල්වා විසින් අයිතිකම්කියන නුගගහමූලහේනද, (පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය), තෙන්නකෝන්මුදියන්සේලාගේ මුදලිහාමි විදනේ සහ පින්හාමි විසින් අයිතිකම්කියන මීගහමූලහේනද; බස්නාහිරට තෙන්නකෝන්මුදියන්සේලාගේ මුදලිහාමි විදනේ සහ පින්හාමි විසින් අයිතිකම්කියන මීගහමූලහේනද, තෙන්නකෝන්මුදියන්සේ උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිකම්කියන මූනමල්ගහකුඹුරුයායද.

IV.—ලංකාමැතිමේ මුල් සිතියම 1,681.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 106 | වැරැල්ලේහේන | 5 0 18 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන කහඹිලියාවේමුකලානද, රජසන්තක වෙරලවත්තද; නැගෙණහිරට තෙන්නකෝන්මුදියන්සේලාගේ බන්ඩිඑතනා විසින් අයිතිකම්කියන පහල දෙපෑලද, මුහන්දිරමලාගේ මුදලිහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කනුකැටියේකුඹුරද; දකුණට මුහන්දිරමලාගේ මුදලිහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන කනුකැටියෙකුඹුරද, කරදපත්තුකෝරලේ මායිමද; බස්නාහිරට කරදපත්තුකෝරලේ මායිමද.

[කුරුනෑගල මී. ම. 80—1921.]

---

[කුරුනෑගල දූන්මීම නො. 7,950.]

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මනත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඈන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මනත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත් සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඈන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මනත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ ගිරතලානේකෝරලේ තල්කුඹුව යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—ලංකාමැතිමේ මුල් සිතියම 1,682.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | අලියාවැටිච්චහේන්යාය | 15 0 9 |

මීට මායිම්—උතුරට පහලමලගනේ යන ගමේ ගම්ඉමද, බෝගොල්ල යන ගමේ ගම්ඉමද; නැගෙනහිරට ආණ්ඩුව විසින් විකුනාපු ගල්රැනේහේනද (342,377 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩමද), ආණ්ඩුව විසින් විකුනාපු දංගහමූලවතතද (339,064 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම) ආණ්ඩුව විසින් විකුනාපු කෝන්ගහමූලවත්තද (339,064 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපු කෝංගහමූලවත්තද (339,064 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම), බෝගොල්ල සිට පහල මලගනේට යන ගන්සභාපාරද; දකුනට බෝගොල්ල සිට පහලමලගනේට යන පාරද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුනාපු අලියවැටිච්චහේන්යායද, (341,720 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම).

II.—ලංකාමැතිමේ මුල් සිතියම 1,682.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 4 | ගන්සභාපාර | 1 1 19 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුනාපු අලියාවැටිච්චහේන්යායද (341,720 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩමද), ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා සහ තවත් අය විසින් අයිතිකම්කියන අලියාවැටිච්චහේන්යායද, ආණ්ඩුව විසින් විකුනාපු කෝංගහමූලවත්තද, (339,064 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපු අලියාවැටිච්ච හේන්යායද (341,673 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම) ආණ්ඩුව විසින් විකුනාපු ගල්රැනේහේනවත්තද (342,377 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපු ගල්රැනෙහේනද, (342,377 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම); නැගෙනහිරට බෝගොල්ල සිට පහළමලගනේට යන පාරද, බෝගොල්ල යන ගමේ ගම්ඉමද ජේ. ජී. තෙන්නකෝන් රටේ මහත්මයා සහ තවත් අය විසින් අයිතිකම්කියන ගල්කන්දේහේනද; දකුණට ආණ්ඩුව විසින් අයිතිකම්කියන කහටගහමූලහේනද, ආණ්ඩුව විසින් විකුනාපු කහටගහමූලවත්තද, (337,963 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම), ආණ්ඩුව විසින් අයිතිකම්කියන කහටගහමූලහේනද, ආණ්ඩුව විසින් විකුනාපු කහටගහමූලවත්තද (342,191 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපු කහටගහමූලහේනද (343,368 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම), ආණ්ඩුව විසින් අයිතිකම්කියන තල්කුඹුවෙලේ පිල්ලෑවද; බස්නාහිරට පහලමලගනේ සිට බෝගොල්ලට යනපාරද, (පහලමලගනේ යන ගමේ ගම්ඉමද).

III.—ලංකාමැතිමේ මුල් සිතියම 1,682.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 5 | ගල්කන්දෙහේන | 15 2 4 |
| 6 | උඩමැව (වැව සහ කන්ඩිය) | 2 3 9 |
| | | 18 1 13 |

මීට මායිම්—උතුරට පහලමලගනේ සිට බෝගොල්ලට යන ගන්සභාපාරද, බෝගොල්ල යන ගමේ ගම්ඉමද; නැගෙනහිරට බෝගොල්ල යන ගමේ ගම්ඉමද; දකුණට තෙකුව යන ගමේ ගම්ඉමද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුණාපු බෙලිගලේ හේනද, (343,348 යන පිඹුරුකඩදසියේ පෙනීයන ඉඩම) ජේ. ජී. තෙන්නකෝන් සහ තවත්අය විසින් අයිතිකම්කියන උඩ කොටුව කුඹුරද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන කහටගහමූලහේනද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1211—1215වෙනි පිටුවල ප්ලෑන් බලනු.

IV.—ලංකාමැනීමේ මුල් සිතියම 1,682.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 15 | තල්කුඹුරුවේවැව (අත්හැරපුවැව) | 6 0 39 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුණපු කහටගහමුලහේනද (343,368 පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම) ; නැගෙනහිරට ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන බක්මීගහකුඹුරද, ආණ්ඩුව විසින් විකුනාපු බතලපිල්ලෑවද, (341,672 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම), ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන අස්වැද්දුමද; දකුණට ආණ්ඩුව විසින් විකුනාපු රෙරගම්වත්තහේනද, (332,477 යන පිඹුරු කඩදාසියේ පෙනියන ඉඩම); බස්නාහිරට ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන තල්කුඹුරුවේවෙලද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන තල්කුඹුරුවෙලේපිල්ලෑවද.

V.—ලංකාමැනීමේ මුල් සිතියම 1,682.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 23 | අඹිපාර | 0 0 9 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුනාපු කෝන්ගහමුලවත්තද, (338,824 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩම), ආණ්ඩුව විසින් අයිතිකම්කියන කොලොන්ගහමුලහේනද ; නැගෙනහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන කොලොන්ගහමුල හේනද, තේකුව යන ගමේ ගම්ඉමද; දකුණට තෙකුව යන ගමේ ගම්ඉමද, ආණ්ඩුව විසින් විකුනාපු කොලොන්ගහමුලවත්තද, (341,728 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම) ; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුනාපු කොලොන්ගහමුලවත්තද, (341,728 යන පිඹුරු කඩදාසියේ පෙනෙන ඉඩම) ආණ්ඩුව විසින් විකුනාපු කෝංගහමුලවත්තද, (338,824 යන පිඹුරුකඩදාසියේ පෙනී යන ඉඩම).

VI.—ලංකාමැනීමේ මුල් සිතියම 1,682.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 27 | වටියවැව (වැව සහ කන්ඩිය) | 0 3 36 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් විකුනාපු ගලගාවහේනද, (343,902 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම); නැගෙනහිරට ආණ්ඩුව විසින් විකුනාපු ගලගාවහේනද, (343,902 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම); ආණ්ඩුව විසින් විකුනාපු වැටියේඉස්මත්තෙහේනද, (343,902 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම); දකුණට ආණ්ඩුව විසින් විකුනාපු වරා හේනද, (341,721 යන පිඹුරුකඩදාසියේ පෙනියන ඉඩම; බස්නාහිරට ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන අස්වැද්දුමද, ආණ්ඩුව විසින් විකුනාපු ගලගාවවත්තද, (337,946 යන පිඹුරුකඩදාසියේ පෙනී යන ඉඩම).

VII.—ලංකාමැනීමේ මුල් සිතියම 1,682.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 5A | කහටගහමුලහේන | 2 3 1 |

මීට මායිම්—උතුරට පහලමලගෙන් සිට බෝගොල්ලට යන පාරත්ද, නැගෙණහිරට ජේ. ජී. තෙන්නකෝන් රටේ මහත්මයා සහ තවත් අය විසින් අයිතිකම්කියන ගල්කන්දෙහේනද, රජසන්තක උඩවැවද, (වැව සහ කන්ඩිය) ; දකුණට ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩකොටුවේකුඹුරද ; බස්නාහිරට 337,963 පිඹුරු කඩදාසියේ ජේන ආණ්ඩුව විසින් විකුනාපු කහටගහමුලවත්තද.

VIII.—ලංකාමැනීමේ මුල් සිතියම 1,682.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 8 | කහටගහමුලහේන | 2 1 5 |

මීට මායිම්—උතුරට පහලමලගෙන් සිට බෝගොල්ලට යන පාරත්ද; නැගෙණහිරට 337,963 පිඹුරුකඩදාසියේ ජේන ආණ්ඩුව විසින් විකුනාපු කහටගහමුලවත්තද, ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා සහ තවත්අය විසින් අයිතිකම්කියන උඩකොටුවකුඹුරද ; දකුණට ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩකොටුවේ කුඹුරද, ජේ. ජී. තෙන්නකෝන් රටේමහත්මයා විසින් අයිතිකම්කියන බක්මීගහකුඹුරද ; බස්නාහිරට 342,191 පිඹුරුකඩදාසියේ ජේන ආණ්ඩුව විසින් විකුනාපු කහටගහමුලවත්තද, පහලමලගෙන් සිට බෝගොල්ලට යන පාරද.

[කුරුණෑගල වි. ම. 81—1921.]

---

[කොළඹ දැන්වීම නො. 7,951.]

වර්ෂ 1897තේ, 1899යේ, 1900යේ සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත කොළඹ කච්චේරියට ඇවිත් බස්නාහිර දිසාවේ කොළඹ සහ මීගමු දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙනීසිට එකී ඉඩම්වලට හෝ ඉන් කොයියම්වූ එකකට තුමුත් තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම කියා නොසිටියොත් එකී උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1897තේ 1වෙනි ආඥාපණතෙන් උන්නාන්සේට ලැබීතිබෙන බලපුළුවන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

එච්. ජ්. තිවුන්හැම්,
කොළඹ සහ මීගමු දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ.

කියන්නේ මේ ඉඩම් ගැණයි.

මීට යාකරණලද සිතියම්වල* පෙනෙන බස්නාඉර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කුවේ නැගෙනහිර සියනෑකෝරලේ උඩුගහ පත්තුවේ බෝපාගම යන ගම පිහිටි මෙහි පහත සඳහම්වූ බිම්කට්ටි :—

මූල් සිතියම 16,946. 1වෙනි කාණ්ඩය.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 2 | වල්ජම්බුවේවත්ත | 0 1 23 |

මෙහි පහත සඳහම්වූ මායිම්—උතුරු නැගෙනහිරට (P.P.16,946/1) දරණ ආණ්ඩුව විසින් අයිතිකම්කියන වල්ජම්බුවේ කැලේද; දකුණුනැගෙනහිරට නො. 214,640 දරණ පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද; දකුණු බස්නාහිරට නො. 204,665 දරණ පිඹුරුකඩදාසියේ පෙණෙන ඉඩම සහ උතුරු බස්නාහිරට නො. 257,697 දන පිඹුරුකඩදාසියෙ ජේන ඉඩමත්ය.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1216වෙනි පිටේ ප්ලෑනය බලනු.

2වෙනි කාණ්ඩය.

| බිම්කට්ටිය. | ඉඩමේ නම | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3 | වල්ජම්බුවේවත්ත | 1 3 14 |

මෙහි පහත සඳහම්වූ මායිම්—උතුරුනැගෙනහිරට නො. 203,498 දරණ පිඹුරුකඩදසියේ පේන ඉඩමද; දකුණු නැගෙනහිරට හික්ගහඇලද; දකුණු බස්නාහිරට නො. 214,640 දරණ පිඹුරුකඩදසියේ පේන ඉඩම සහ උතුරු බස්නාහිරට (P. P. 16,949/1)දරණ ආණ්ඩුව විසින් අයිතිකම්කියා සිටින වල්ජම්බුවේකැලේ සහ නො. 282,223 සහ 232,479 දරණ පිඹුරු කඩදසිවල පේන ඉඩම්ය.

---

[කොළඹ දැන්වීම නො. 7,952.]

**වර්ෂ 1897තේ, 1899යේ 1900යේ සහ 1903යේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණතේ ප්‍රකාර දැනුම්දීම.**

මෙහි පහත සඳහන්වෙන ඉඩම් සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත කොළඹ කච්චේරියට ඇවිත් බස්නාහිර දිසාවේ උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙනීසිට එකී ඉඩම්වලට නොහොත් එයින් එකකට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම තමන් විසින් හෝ ලියවිල්ලකින් කියා නොපියොත් එකී ඒජන්ත උන්නාන්සේ විසින් ඉහතකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබීතිබෙන බලපූර්වත්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලිවිල්ලකින් එළිදරව්කරණබව මෙයින් දැනගත යුතුයි.

එච්. ඒ. නිවුන්හැම්,
කොළඹ සහ මීගමු දිස්ත්‍රික්කවල ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ.

සැලකියයුතුයි.—මෙම ඉඩම් හෝ ඉඩමක් මැදින් වැටී තිබෙන යම් පාරකට අයිතිවාසිකම්කීම් මෙම ඉඩම්වලට හෝ ඉඩමකට අයිතිවාසිකම්කීම හා සමාන බව සලකනු.

කියන්නේ මේ ඉඩම් ගැනයි.

මීට යාකරනලද සිතියමේ* පෙනෙන බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කුවේ හේවාගම්කෝරලේ මැදපත්තුවේ ගලගෙදර යන ගම පිහිටි මෙහි පහත සඳහන්වූ බිම්කට්ටි, එනම් :—

මුල් සිතියම 17,112.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම; අ. රූ. ප. |
|---|---|---|
| 1 | ගල්බොඩලන්ද (පී. ඩබ්ලිව්. ඩී. ඕර්සියල්ගේ ගෙට තහනම්) | 0 1 24 |
| 2 | ගල්බොඩලන්ද (කරත්තපාරට තහනම්) | 0 0 16 |
| 3 | ගල්ගොඩලන්ද | 1 0 22 |
| 5 | ගල්බොඩලන්ද (ගල්කඩන තැනට තහනම්) | 0 1 14 |
| 6 | ගල්බොඩලන්ද (පී. ඩබ්ලිව්. ඩී. කුලීකාරයින්ගේ ලයිම්වලට තහනම්) | 0 2 13 |
| 7 | ගල්බොඩලන්ද | 1 1 5 |
| 7A | එම | 0 2 20 |
| | | 4 1 34 |

මෙහි පහත සඳහන්වූ මායිම්—උතුරට ඩබ්ලිව්. ආර්. ප්‍රනාන්දු සහ එච්. පීලන් ප්‍රනාන්දු විසින් අයිතිකම්කියන ගල්බොඩලන්ද, (P. P. 12,553/17,479) සහ මුල් සිතියමේ (12,913/19,431) පෙන්නා තිබෙන ඉඩමද; නැගෙනහිරට, ඩී. පී. පී. ගුනවර්දන සහ තවත් අය විසින් අයිතිකම් කියාසිටින පොල්කොරටුවේදෙනිය; ආණ්ඩුව විසින් අයිතිකම් කියා සිටින ගල්බොඩලංද (P. P. 17,112/4) පිඹුරු ඔප්පු (257,471) යේ පෙන්නා තිබෙන ඉඩමද; ආණ්ඩුව විසින් අයිතිකම් නොකියන ගල්බොඩලංද (P. P. 17,112/8) සහ පිඹුරු ඔප්පු 257,585යේ පෙන්නා තිබෙන ඉඩමෙන්ද; දකුණට ජී. ආව්ස්සිංඤෝ සහ තවත් අය විසින් අයිතිකම් කියා සිටින දෙල්ගහවත්ත, වී. සී. ද සිල්වා විසින් අයිතිකම් කියා සිටින දෙල්ගහවත්ත; බස්නාහිරට පාදුක්කෙ සිට හන්වැල්ලට යන මහපාර.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1217වෙනි පිටේ ප්ලෑනය බලනු.

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

**ආණ්ඩුවේ ඉඩම් ගොඩනැගිලි සමග බදුදීම.**

මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුවේ ඉඩම් එහි තිබෙන ගොඩනැගිලි සමග 1921කේ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් අවුරුදු දෙකකට බදු ගැණීම පිණිස එවනුලබන ඉල්ළුම්පත්‍ර බස්ණාහිර පළාතේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මුද්‍රකරණලද ඉල්ළුම්පත්‍ර 1921ක්වූ සැප්තැම්බර් මස 28 වෙනි බදාදා දවල් 12ත වෙනතුරු භාරගෙන ඊට පසුව කඩා බලනු ලැබේ. ඉල්ළුම්පත්‍ර සැබෑබව ඔප්පුදීමට ඉල්ළුම්කරන්නාවූ සියලුදෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමුන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙණීසිටින්ට ඕනෑය.

**කොන්දේසි.**

1\. ඒජන්ත උන්නාන්සේ කැමතිනම් වැඩිම ඉල්ළුම්කාරයා ගැණුම්කාරයාමෙන් ප්‍රකාශ කරණු ලැබේ.

2\. බදු මුදලෙන් දෙලහෙන් කොටසක් ඇපවසයෙන් වෙන්දේසි දිනදීම බැදියයුතුයි. තවද මාසයට වැටෙන බදු මුදල එක එක මාසය මුලදී ගෙවිය යුතුයි.

3\. ඉඩම සහ ගෙවල් බුක්තිවිදීමට හෝ ගෙවල් මාස්ගණන් කුලියට දීමටද බදුකාරයාට බලය තිබේ.

4\. එහි තිබෙන කිසිම ගහක් කැපීමට හෝ එහි වැටක්, මායිමක් හෝ ගොඩනැගිල්ලක් වෙනස්කරන්ට හෝ අවසර නැත.

5\. බදුකාරයා ඉඩම පවිත්‍රව තැබිය යුතුයි. සියලුම වරිපනම් ගෙවිය යුතුයි. නාගරික සභාවේ පණත්වලට එකඟව වැඩ කළයුතුයි. වැඩිදුරටත් බදුකාරයා ඒජන්ත උන්නාන්සේ හෝ එතුමාගේ බලය යටතේ ක්‍රියාකරණ කෙනෙකුගේ සිත් සතුටුවෙනාකාර ඉඩම සහ එහි ගොඩනැගිලිත් පවිත්‍රව සහ හොඳකාර තිබීම පිණිස කටයුතු අළුත් වැඩියාකම් සියල්ලම කළයුතුයි.

6\. බදුකාරයාට දෙමාසයකට ප්‍රථම දැනුම්දී ඒජන්ත උන්නාන්සේට හෝ එතුමාගේ බලය යටතේ ක්‍රියාකරණ කොයිම කෙනෙකුට කොයිවේලාවේ නුමුත් එම ඉඩමේ භුක්තිය භාර ගැණීමට බලය තිබේ.

7\. ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතිව මේ ඉඩම් වෙන බද්දකට දීමට අවසරනැත.

8\. එහි පදිංචිව සිටින යම්කෙනෙකු විසින් ඉඩමට හෝ ගොඩනැගිලිවලට කරණු ලබන අනතුරුයන්ගැණ බදුකාරයා වග කියයුතුයි.

9. බද්ද මාරුවෙන්ට ප්‍රථම මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑකළොත් දෙමාසයක් කල් දුන්නුවිට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නාලද මුළු ඉඩම හෝ ඉඩම් කොටසට ගතවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයට බදු මුදල අඩුකරන්ට යෙදෙනවා ඇත.

10. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකළොත් බදුකාරයා ඉඩමෙන් අහක්කර වන්දි නොගෙවා ඉඩම් භුක්තිය භාරගැණීමට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

11. බද්ද තිබ කාලයට ඉවරවීමේදී හෝ ඊට ප්‍රථමයෙන් ඉවරවීමේදී බදුකාරයා එම ඉඩම සහ ගොඩනැගිලිත් හොඳ කාර ඒජන්ත උන්නාන්සේට හෝ එතුමා විසින් පත්කරණ ලද මුලාදෑනියෙකුට භාරදිය යුතුයි.

12. යම් කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාඇත.

එම ඉඩම්නම්.

කොළඹ අළුත්කඩේ පිහිටි නො. 4–4B දරණ ඉඩම සහ එහි තිබෙන ගෙවල්.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ඒජන්ත වම්හ.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 6වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

---

මෙහි පහත සඳහන්වෙන පුත්තලම් දිස්ත්‍රික්කුවේ පාලම් රේන්ද වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1922ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා දොළොස් මාසයකට ආණ්ඩුවෙන් බදුගැණීමට එවනලද මුද්‍රලත් ඉල්ලුම් පත්‍ර පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

පෙරකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මතුපිට හෙවත් ඇන්විලොප් උඩ "Tenders for Toll Rents" "රේන්ද සඳහා ඉල්ලුම්පත්‍ර" යන වාසගම ඇතුව වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 19වෙනි දින වන සඳුදා උදේ 10.30ට පුත්තලම් කච්චේරියේදී භාරගනු ලැබේ. ඉල්ලුම්කාරයෝම පෙනීසිට ඔවුන්ගේම අතින් ඉල්ලුම්පත්‍ර භාරදෙන්ට ඕනෑය. තැපැල් මගින් එවනලද එකම ඉල්ලුම් පත්‍රයක්වත් භාරගනු නොලැබේ. ඉහත පෙනෙන වේලාවට පසු එවනලද කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

2. උප ඒජන්ත උන්නාන්සේ විසින් උතුමාණන්වහන්සේ වෙත ඔප්පුකර සිටීමට තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනෙන් දහයෙන් කොටසකට වැටගෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තබන්ට ඕනෑවා පමණකුත් නොව එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්නට යෙදුනිනම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දෙන දින සිට 30 දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්දර ඔප්පුවලින් හෝ තුනෙන් කොටසකට වටින ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

3. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීමට සහ ඔප්පුවල සඳහන් ඇප ඉඩම් ගැණ අදහස ප්‍රකාශකිරීමටද, ආණ්ඩුවේ පෙරකදෝරු උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුද, එසේම ඇප ඔප්පු සෝදිසිකිරීමට සහ ඒවා සම්පූර්ණකිරීමටද, ලියමන් ආදිය පරීක්ෂාකිරීමටද. වර්ෂ 1919යේ නොම්මර 10යේ රෙගුලාසිය යටතේ ගෙවියයුතු ඔප්පුවලට මුද්දර ගාස්තුද, යන සියල්ලම ගෙවීම පිණිස මුදල් බඳින්ට ඕනෑය.

4. ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියා පදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍රය ලබාගැණීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දැරිය යුතුයි.

5. වැඩිදුර කාරණ පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගත හැක.

ඇල රේන්ද.
පාලාවි

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
පුත්තලම් හලාවත දිස්ත්‍රික්කවල උප ඒජන්ත
උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 6වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912යේ අඩංකු 8 දරණ ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

වර්ෂ 1921ක්වූ ජූනි මස 10වෙනි දින නොම්මර 123 දරණ මත්පැන් සම්බන්ධ දැන්වීමේ ප්‍රකාශකරණලද පනත්වල නොම්මර 5 පනතෙන් දෙනලද බලප්‍රකාර බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත දක්වන දින සහ තැන් මෙහි පහතදක්වනලද අරක්කු තැබෑරුම්වල ප්‍රයෝජනය දරනලද සීමා සහිත කොට්ඨාසතුළ පදිංචි ඇසබද්ද ගෙවන අයවළුන්ගෙන් සියයට 75 දෙනෙක් බැගින් ඒ නගරවල අරක්කු විකිණීමට තැබෑරුම් පිහිටුවීමට විරුඬද කියා දැනගැණීම පිණිස කැමැත්තදෙන අය ගණන්ගැනීමට පහසු දින සහ පහසු ස්ථාන හැටියට නියමකර තිබෙන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙසින් ප්‍රකාශකරනු ලැබේ.

### උතුරු අළුත්කුරුකෝරළේ.

| දින. | වේලාව. | ස්ථානය. | අරක්කුතැබෑරුම. | සීමාව (ගම්). |
|---|---|---|---|---|
| 1921. ඔක්තෝබර් 19 | .. උදය 8 සිට 11.30 දක්වා | කටානේ ගම්සභාවේ | කටානේ නැගෙනහිර | අම්බලයාය, ආඩිමුල්ල, හල්පේ, කෝන්ගඩමුල්ල, කටානේ නැගෙනහිර. |
| එම 19 | .. සවස 1 සිට 3 දක්වා | එම .. | දිසාගේවත්ත | කටුවැල්ලගම, කිනවින්න, කලුවේඉරිප්පුව නැගෙණහිර, දෙමටඹිට, දිසාගේවතත, මිරිස්වත්ත, කඩවල. |
| නොවැම්බර් 2 | .. උදය 8.30 සිට 11.30 දක්වා සවස 1.30 සිට 3 දක්වා | කටුනායකඉංග්‍රිසිවැස්ලියන් ඉස්කෝලයේ | කටුනායක .. | කුරන කටුනායක, කටුනායක, ලියනගේමුල්ල, කදිරන දකුන, කන්දඑලිය, ගොලුවාපොකුන. |
| ඔක්තෝබර් 19 | .. උදය 8 සිට 11.30 දක්වා | කටානේ ගම්සභාවේ | කටානේ බස්නාහිර | කලුවඉරිප්පුව බස්නාහිර. |
| නොවැම්බර් 4 | .. උදය 8.30 සිට 11.30 දක්වා සවස 1.30 සිට 4.30 දක්වා | සීදූවේ රෝමානු පිරිමි ඉස්කෝලයේ | සීදූව .. | බන්ඩාරවතත, මුකලංගමුව, අම්බලන්මුල්ල, කිදිගොඩ, සීදූව, අමන්දෙළුව, අවරියාවත්ත, හල්ගස්තොට, රද්දොළුව, වැත්තෑව, තැම්පොල, මුතුවාඩිය, කැස්වල. |
| එම 8 | .. උදය 8 සිට 11.30 දක්වා දවල් 1 සිට සවස 3 දක්වා | දූනගහ පරණ පන්සලේ බනමඩුවේ | කැලපිටමුල්ල | පල්ලියපිටිය, තම්මිට, බරවාවිල, හපුගහගම, හුනුමුල්ල, ඌරපාන, කැලපිටිමුල්ල, සායක්කාරමුල්ල, හේන්පිටගෙදර, හපුවලාන, මාපලන්ගෙදර, දූනගහ, බඩේපොල. |

| දින. | වේලාව. | ස්ථානය. | අරක්කු තැබෑරුම්. | සීමාව (ගම). |
|---|---|---|---|---|
| නොවැම්බර් 16 .. | උදය 8 සිට 11.30 දක්වා | බඩල්ගම තානායමේ | දෙල්පකඩවල | පෙතිගොඩ, කටුකෙන්ද, අලුගොල්ල, දෙල්පකඩවර, බඩල්ගම, ආකරන්ගහ, හොරකන්දවිල, දෙල්වගුර, කෙහෙල්ඇල්ල. |
| ඔක්තෝබර් 31 .. | උදය 7.30 සිට 11.30 දක්වා සවස 1 සිට 5 දක්වා | උඩුගම්පොල ඉංග්‍රීසි ඉස්කෝලයේ | උඩුගම්පොල .. | ගාල්ලේගෙදර, මාකලන්දන, වැලිකඩ, පෙතියගොඩ, දෙරනාගොඩ, හැදිමහර, උඩුගම්පොල, ගොවිගම, දෙඹවල, පැදිපොල, මිතුමුල්ල, කෙහෙල්බද්දර, උග්ගල්බොඩ, විදියවත්ත. |
| එම 14 .. | උදය 8 සිට 11.30 දක්වා සවස 1 සිට 3 දක්වා | මිනිවන්ගොඩ තානායමේ | මිනිවන්ගොඩ | මැදමුල්ල, නිල්පනාගොඩ, වෑගොව්ව, මාතම්මන, වැල්හේන, වැලිය, එල්ලන්ගල, පාතංදුවන, පොල්වතත, ගල්බඑව, බොරකඩවත්ත, මිනිවන්ගොඩ, අඹගහවත්ත, වතෙතගෙදර, පත්සිල්ගොඩ, බුරුලපිටිය. |
| | | **දකුණු අලුත්කුරුකෝරලේ.** | | |
| ඔක්තෝබර් 13 .. | දවල් 11 සිට සවස 4 දක්වා | තෙලගපාත බුඩාගමේ බනමඩුවේ | පන්ගහකැලේ | තෙලගපාත. |
| එම 6 .. | උදේ 8 සිට සවස 4 දක්වා | පල්ලියවත්තේ රෝමානු පිරිමි ඉස්කෝලය | පල්ලියවත්ත | පල්ලියවත්ත. |
| | | **බස්නාහිර සියනෑකෝරලේ.** | | |
| එම 29 .. | උදේ 10 සිට සවස 3 දක්වා | කඩවත රෝමානු ඉස්කෝලයේ | පුවක්වැටිය .. | සූරියපාලුව, පුවක්පිටිය, ඉහලබියන්විල. |
| නොවැම්බර් 3 .. | උදේ 10 සිට සවස 4 දක්වා | වරගොඩ මිශ්‍ර ඉස්කෝලයේ | පෙතියගොඩ .. | වේවැල්දූව, දලුගන්ගොඩ, තුන්ගමුගොඩ, දිප්පිටිගොඩ, බඩල්ගොඩ, වෙදමුල්ල, බඹහැලගොඩ, පෙතියගොඩ, කැලනිය, සිංහාරමුල්ල, පිලපිටිය. |
| එම 7 .. | උදේ 10 සිට සවස 4 දක්වා | මාබිම ගෑනු ඉස්කෝලයේ | මාබිම .. | හෙයියන්තුඩුව, මාබිම, ගෝනවල, පට්ටිවිල, වතුරපාත. |
| එම 10 .. | උදේ 9 සිට සවස 5 දක්වා | උඩුපිල පිරිමි ඉස්කෝලයේ | දෙල්ගොඩ .. | මීගහවත්ත, දෙල්ගොඩ, කොලුන්මහර, කම්මල්වත්ත, සියඹලාපේ, යටිහේන, දරනගම, වල්ගම, කඳුබොඩ, අලුබෝමිල, අකුරුමුල්ල, නාරන්වල, අඹගම්මන, උඩුපිල, වල්අරඹේ, දෙමලගම, හෙලුන්මහර, පතන්වල, පැලහැල. |
| | | **නැගෙණහිර සියනෑකෝරලේ.** | | |
| නොවැම්බර් 1 .. | උදය 8 සිට සවස 5 දක්වා | පස්යාල පොලිස් උසාවියේ | පස්යාල .. | පල්මඩ, පොහොන්ඔරුව, හඳුරුමුල්ල, මූරුතාවල, හාපිටිගම, මකානිගොඩ, බටලීය, කල්එලියේ පල්ලේවෙල, හිරිවලාමුල්ල, කල්එලියේ උඩුවෙල, මිදල්ලකොටුව, මල්ලහේව, බොලන, දමුන්හේගෙදර, කලටුවාව, පස්යාල, නබුලුව, කිතනවතත, වෙදගම, ගවගමුව, කලල්පිටිය, වේයන්ගොඩ, එල්ලකාල, ඇල්ලමුල්ල, මීවිටිය, දබහෙර, හැදිදෙනිකන්ද, මීරසූරිකන්ද, දෙමටදෙනිකන්ද, රදවාදුන්න. |
| | | **හේවාගම්කෝරලේ.** | | |
| ඔක්තෝබර් 28 .. | උදේ 10 සිට සවස 2 දක්වා | කොස්ගම ගෑණු ඉස්කෝලයේ | කොස්ගම .. | වවල්ගොඩ, දූත්තර, මුරුතැගම, කොස්ගම පහල, කොස්ගම ඉහල, ඇස්වත්ත, හිගුරල, බොල්ලතාව, අකරවිට. |
| එම 31 .. | උදේ 10 සිට සවස 2 දක්වා | අඹතලේ පිරිමි ඉස්කෝලයේ | වැලිවිට .. | බොල්ලෑගල, හේවාගම, වැලිවිට, මුල්ලේරියාව උතුර, (අඹතලේ) මුල්ලේරියාවේ උඩුමුල්ල, මුල්ලේරියාවේ හිඹුටාන. |
| | | **කොළඹ මුදලිතැනගේ පලාතේ.** | | |
| ඔක්තෝබර් 19, 20, 21, 22 දිනවල | උදේ 9 සිට දවල් 12 දක්වා සහ දවල් 1 සිට සවස 6 දක්වා | ආමර්වීදියේ නො. 52 දරණ දංගහතොටුපල කියන ස්ථානය | ආර්මර් ඉස්ට්‍රීට් | නිව්බසාර් වෝඩ්. |
| එම . | එම .. | — .. | ග්‍රන්පාස් (කොස්ගස්ලග) | එම |

වශ 1921ක්වූ සැප්තැම්බර් මස 5වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්තතැන වම්හ.

---

වශ 1921ක්වූ ජූනි මස 10වෙනි දින නොම්මර 125 දරණ මත්පැන් සම්බන්ධ දැන්වීමේ ප්‍රකාශකරනලද පණත්වල නොම්මර 5 පණතෙන් දෙනලද බලය ප්‍රකාර බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත දක්වන දින සහ තැන් මෙහි පහත දක්වනලද රටබීම තැබෑරුමේ ප්‍රයෝජනය දරණලද සීමාසහිත කොටස තුළ පදිංචි ඇඟබද්ද ගෙවන අයවලුන් ගෙන් සියයට 75 දෙනෙනක් බැගින් ඒ නගරයට රටබීම විකිණීමට තැබෑරුම පිහිටවීමට විරුද්දද කියා දැනගැණීම පිණිස කැමැත්තදෙන අය ගණන්ගැණීමට පහසු දින සහ පහසු ස්ථානය හැටියට නියමකර තිබෙනබව මහජනයාගේ දැනගැනීම පිණිස මෙසින් ප්‍රකාශකරණු ලැබේ.

| දින 1921. | වේලාව. | ස්ථානය. | රටබීම තැබෑරුම. | සීමාව (ගම.) |
|---|---|---|---|---|
| ඔක්තෝබර් 14 | උදේ 8 සිට 11.30 දක්වා දවල් 1 සිට සවස 3 දක්වා | මිනිවන්ගොඩ තානායම .. | මිනිවන්ගොඩ .. | මිනිවන්ගොඩ ලෝකල්බෝඩ්. |

වශ 1921ක්වූ සැප්තැම්බර් මස 5වෙනි
දින කොළඹ-කච්චේරියේදීය

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්තතැන වම්හ.

වර්ෂ 1921ක්වූ ජූනි මස 10වෙනි දින නොම්මර 124 දරණ මත්පැන් සම්බන්ධ දූත්වීමේ ප්‍රකාශකරනලද පනත්වල නොම්මර 5 පනතෙන් දෙනලද බලය ප්‍රකාර බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත දක්වන දින සහ තැන් මෙහි පහත දක්වනලද රා තැබෑරුම්වල ප්‍රයෝජනය දරනලද සීමා සහිත කොඨාසතුළ පදිංචි ඇගබද්ද ගෙවන අය වලුන්ගෙන් සියයට 75 දෙනෙක් බැගින් ඒ නගරවල රා විකිනීමට තැබෑරුම් පිහිටුවීමට විරුඬද කියා දූනගැනීම පිණිස කැමැත්ත දෙන අය ගණන් ගැනීමට පහසු දින සහ පහසු ස්ථාන හැටියට නියමකර තිබෙන බව මහජනයාගේ දූනගැනීම පිණිස මෙයින් ප්‍රකාශකරනුලැබේ.

උතුරු අළුත්කුරුකෝරලේ.

| දින. | වේලාව. | ස්ථානය. | රා තැබෑරුම. | (සීමාව) ගම්. |
|---|---|---|---|---|
| 1921 ඔක්තෝබර් 21 | උදේ 8 සිට 11.30 දක්වා, සවස 1 සිට 5 දක්වා | ගනේමුල්ලෙ බුඩාගමේ ගැනු සොකෝලයේ | ගනේමුල්ල .. | වඩුමුල්ල, පල්ලියපියන, ඇස්සල, දේවාලපොල, මීගස්පිටිය, ගනේමුල්ල, ගාල්ලේගෙදර, මාකලංදන, වැලිකඩ, බුලුගහමුල්ල, කලවාන, පමුනුව, හැලකන්දන, බලබෝව, හැන්දිමහර, කමරගොඩ. |
| ඔක්තෝබර් 28 | උදේ 7.30 සිට 11.30 දක්වා | හීනැටියන ආණ්ඩුවේ පිරිමි සොකෝලයේ | මඩවල .. | උන්නාරුව, ගමන්ගෙදර, කෝවින්න, මඩවල, මාදුව, වලගේගොඩ, අරබේ, දේවමොට්ටාව, කලහපිටිය, පල්ලේවැව, වෑත්තෑව, තැම්පොල. |
| ඔක්තෝබර් 25 | උදේ 8 සිට 11.30 දක්වා | පොල්වත්තේ බුඩාගමේ මිශ්‍රසොකෝලයේ | පොල්වත්ත .. | පාතන්දුවන, පොල්වත්ත, ගල්ඔලුව, කලහුගොඩ. |
| ඔක්තෝබර් 19 | එම | කටානේ ගම්සභාවේ .. | කටාන .. | කටානෙ නැගෙනහිර, කලුවඉරිප්පුව බස්නාහිර. |
| නොවැම්බර් 2 | උදේ 8.30 සිට 11.30 දක්වා දවල් 1.30 සිට සවස 3 දක්වා | කටුනායක වැස්ලියන් ඉංග්‍රිසි සොකෝලයේ | කටුනායක .. | කුරනකටුනායක, කටුනායක, ලියනගේමුල්ල, අවරියවත්ත, හල්ගස්තොට, කඳිරන දකුන, කන්දඑලිය, ගොලුවාපොකුන, මුතුවාඩිය. |
| නොවැම්බර් 4 | උදේ 8.30 සිට 11.30 දක්වා දවල් 1.30 සිට 4.30 දක්වා | සිදූවේ රෝමානු පිරිමි සොකෝලයේ | මූකලංගමුව .. | බන්ඩාරවත්ත, මූකලංගමුව, අම්බලම්මුල්ල, කිඹිගොඩ, සිදූව, අමන්දෙලුව, රද්දෙලුව, කුස්වල. |
| නොවැම්බර් 8 | උදේ 8 සිට 11.30 දක්වා සවස 1 සිට 3 දක්වා | දූනගහ පරන පන්සලේ බනමඩුවේ | දූනගහ .. | පල්ලියපිටිය, හුනුමුල්ල, කැලපිටිමුල්ල, සායක්කාරමුල්ල, හේන්පිටගෙදර, හපුවලාන, දූනගහ, අදිකාරිමුල්ල, බවේපොල, ඉදුරේ අගාරේ. |
| ඔක්තෝබර් 19 | දවල් 1 සිට සවස 3 දක්වා | කටානේ ගම්සභාවේ .. | දෙමටඹිට .. | කෝන්ගඩමුල්ල, දෙමටඹිට, දිසාගේවත්ත, මිරිස්වත්ත, කඩවල. |
| නොවැම්බර් 11 | උදේ 8 සිට 11.30 දක්වා දවල් 1 සිට සවස 4 දක්වා | මාබෝදල ආණ්ඩුවේ පිරිමි සොකෝලයේ | අසනාවතත .. | හොරගස්මුල්ල, බොම්බුගමෙන, මාබොඩල, විතානමුල්ල, වටිනාපහ, මඩිත්තේගම, අසනාවතත. |
| නොවැම්බර් 15 | උදේ 8.30 සිට 11.30 දක්වා | ඇස්සල ආණ්ඩුවේ ගැනු සොකෝලයේ | නයිවල .. | නලපායේ, නයිවල, මැදගම්පිටිය, යටගම, වල්පිටමුල්ල, මාරපොල, එලුවාපිටිය, උඩුගම. |
| ඔක්තෝබර් 14 | උදේ 8 සිට 11.30 දක්වා දවල් 1 සිට සවස 3 දක්වා | මිනිවන්ගොඩ තානායමේ | මිනිවන් ගොඩ | මැදමුල්ල, වැල්හේන, එල්ලන්ගල, බොරකඩවත්ත, මිනිවන්ගොඩ, අඹගහවත්ත, වත්තේගෙදර, පන්සිල්ගොඩ, බුරුල්ලපිටිය. |

දකුණු අලුත්කුරුකෝරලේ.

| | | | | |
|---|---|---|---|---|
| ඔක්තෝබර් 6 | උදේ 8 සිට සවස 4 දක්වා | පල්ලියවත්තේ රෝමානු පිරිමි සොකෝලයේ | පල්ලිය වත්ත | පල්ලියවත්ත, හේකිත්ත. |
| ඔක්තෝබර් 20 | උදේ 8 සිට සවස 4 දක්වා | පමුනුගම රෝමානු පිරිමි සොකෝලයේ | මහවත්ත .. | පමුනුගම, මහවත්ත. |

බස්නාහිර සියනෑකෝරලේ.

| | | | | |
|---|---|---|---|---|
| ඔක්තෝබර් 20 | උදේ 10 සිට සවස 3 දක්වා | තිහාරියේ මොහොම්මදු සොකෝලයේ | තිහාරියේ .. | කත්තොට, තිහාරිය, කලගෙඩිහේන, කටුවස්ගොඩ. |
| ඔක්තෝබර් 22 | උදේ 11 සිට සවස 3 දක්වා | කොට්ටල හන්දියේ විදුන ආරච්චිරාලගේ ගෙදර | බෝරුක්ගමුව | මිදල්ලවල, රන්දෙනිපල්ලේවල, වල්බොලාන, වෑරගොඩ, කුකුල්නාපෙ, පැලපිටිගම, උතුවන්බෝගහවත්ත, බෝරුක්ගමුව, කැන්දලන්ද, තෝරපිටිය, වත්තේගෙදර, හුන්ගමුව. |
| ඔක්තෝබර් 25 | උදේ 11 සිට සවස 4 දක්වා | බියගම පිරිමි සොකෝලයේ | බියගම .. | මාබිම, පට්ටිවිල, වතුරපාත, බියගම, යබරලුව. |

නැගෙනහිර සියනෑකෝරලේ.

| | | | | |
|---|---|---|---|---|
| ඔක්තෝබර් 29 | දවල් 12 සිට සවස 4 දක්වා | පූගොඩ ගම්සභාවේ .. | නිකවෙල .. | දූනමුල්ල, ගල්පොතුගොඩ, ගිරිදර, නිකවල, ගම්පොල ගෙදර, මුලටියාන, කපුගොඩ, කොස්පිටියාන, කුමාරිමුල්ල, ඕවිටිගම, පූගොඩ, බඳුකන්දන. |
| ඔක්තෝබර් 28 | දවල් 12 සිට සවස 5 දක්වා | අත්තනගල්ලේ පන්සලේ | මාතලානෙ .. | බෝගොඩ, වතුපිටිවල, මාඉඹුල, වල්පොල, උඩුගොඩ, මාතලානෙ, කඹුරුගොල්ල, පන්තිල, හුනුපොල, හක්ගල. |

| දින. | වේලාව. | ස්ථානය. | රා තැබෑරුම. | (සීමාව) ගම. |
|---|---|---|---|---|
| නොවැම්බර් 1 | උදේ 8 සිට සවස 5 දක්වා | පස්යාලේ පොලිස්උසාවියේ | රදාවඩුන්න .. | පල්වඩ, කෑපාහොන්ඔරුව, හඳුරුමුල්ල, වේවැල්දෙනියේ ඉහලගම, පලාපිටිය, මිල්ලාවල, වේවැල්දෙනිය පහලගම, හාපිටිගම, මක්කනිගොඩ, බටලීය, හැඹිදෙනකන්ද, වීරසූරිකන්ද, දෙමටදෙනිකන්ද, රදාවඩුන්න. |
| | | සල්පිටිකෝරලේ. | | |
| ඔක්තෝබර් 8 | උදේ 8 සිට සවස 5 දක්වා | කැස්බෑවේ තානායමේ .. | බටකැත්තර .. | බටකැත්තර, දම්පෙ, මඩපාත, මාකන්දන, දෙමලදූව, බෙරවාවල, කහපොල. |
| | | හේවාගම්කෝරලේ. | | |
| ඔක්තෝබර් 28 | උදේ 10 සිට සවස 2 දක්වා | කොස්ගම ගෑනු සෙකොලයේ | කොස්ගමඉහල | තවල්ගොඩ, දත්තර, මුරුතෑගම, කොස්ගම පහල, කොස්ගම ඉහල, කරගල්ල, අරපාන්ගම, කඩුගොඩ, කහපොල, ඌරුවල. |
| නොවැම්බර් 4 | උදේ 10 සිට සවස 2 දක්වා | කලපලුවාවේ බුඩාගමේ මිශ්‍ර සෙකොලයේ | කලපලුවාව .. | තලංගම උතුර, තලහේන, තලංගම දකුණ, මාදින්නාගොඩ, කොටුවේගොඩ, කලපලුවාව, වල්පොල, බත්තරමුල්ල. |
| | | කොළඹ මුදලිතුමාගේ පලාතේ. | | |
| ඔක්තෝබර් 25 | උදේ 8.30 සිට දවල් 12 දක්වා සහ දවල් 1 සිට සවස 6 දක්වා | රාජගිරිය සෙකොලයේ .. | වැලිකඩ .. | වැලිකඩ (217) එගොඩකොලොන්නාව, වැලිකඩ (514) යක්බැද්ද, නාරාහේන්පිට (කොටසක්) නාවල, ඇතුල්කෝට්ටේ, පිටකෝට්ටේ. |
| ඔක්තෝබර් 19, 20, 21, 22 | උදේ 9 සිට දවල් 12 දක්වා සහ දවල් 1 සිට සවස 6 දක්වා | ආමර්වීදියේ නො. 52 දරණ දන්ගහ කොටුපල කියන ස්ථානයේ | ප්‍රින්සස් ගේට් | තිව්බෑහාර් වෝඩ්. |
| එම | එම .. | එම .. | ආර්මර් ඉස්ට්‍රීට් | එම |

වර්ෂ 1921ක්වූ සැප්තැම්බර් මස 5වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්තතැන වම්භ.

---

**වර්ෂ 1912, අංක 8, මත්පැන් සම්බන්ධ ආඥාවයටතේ දැන්වීමයි.**

වර්ෂ 1921ක්වූ ජූනි මස 10වෙනි දින අංක 123 දරණ මත්පැන් සම්බන්ධ දැන්වීමේ ප්‍රකාශ කරණලද පනත්වල අංක 5 නියෝගයෙන් දෙනුලැබූ බලය ප්‍රකාර දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් හබක්කල අරක්කු තැබෑරුමෙන් ප්‍රයෝජනය දරණ පලාත්වල ඇහබද්ද ගෙවන අයවලුන්ගෙන් සියේට හැත්තෑපස්දෙන බැයින් ඒපලාත්වල අරක්කු විකිණීම සඳහා තැබෑරුම පිහිටුවීමට විරුඬද යනබව දැනගැණීම පිණිස කැමැත්ත දෙන අයවල් ගනන් ගැණීමට මෙහි පහත දක්වන දින සහ ස්ථානය නියමකර තිබෙනබව මහජනයාගේ දැනගැණීම සඳහා මෙයින් ප්‍රකාශ කරණලැබේ.

වර්ෂ 1921ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින සවස 2කේ සිට 5·30 වනතුරු ගාළු දිස්ත්‍රික්කේ බෙන්තර වලල්ලාවිටි කෝරලේ ඉදුරුවේ ආණ්ඩුවේ පාඨශාලාවේදීය.

මෙම තැබෑරුමෙන් ප්‍රයෝජනය ලබන ගම් නාම්: ජෝරිස්ගොඩ, කහගෙව ගම්මැද්දේගොඩ, ඔලීගොඩ, ඇකාබෙගොඩ, වරකාමුල්ල, කන්දේමුල්ල, මානානෙඋඩුමුල්ල, ගල්ගොඩ සහ හබක්කලත්ය.

වර්ෂ 1921ක්වූ අගෝස්තු මස 31වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඈෆ්. බාව්ලට්,
දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

---

**අන්‍ය දැන්වීම්යි.**

කළුතර දිස්ත්‍රික්කුවේ පානදුරතොටමුනේ පානදුරබද්දේ, වලානේ පදිංචි ජෙන් බාර්න්ස් ප්‍රැන්සිස් කරුනාරත්න වන මා කළුතර දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිඬ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරනලෙස රිජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්වන්ට අදහස්කර සිටිනබව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1921ක්වූ ජූනි මස 7වෙනි දින පානදුර වලානේදීය.

ඞී. බී. ඈෆ්. කරුනාරත්න.

---

H. R. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.